**ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 3.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම හේතුවෙන් එහි ඒසීඒ 2(ii) ආකෘතියේ ඇතුළත් රු.1,291,439,650 ක් වූ වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ රු.1,329,379,609 ක් වශයෙන් රු.37,939,959 ක් වැඩියෙන්ද, රු.639,600,165 ක් වූ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් රු.601,660,206 ක් වශයෙන් රු.37,939,959 ක් අඩුවෙන් ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි. | අතපසුවීමකින් සටහන් අංක 06 ට ඇතුළත් විය යුතු දේශීය හා විදේශීය ගමන් වියදම් සටහන් අංක 05 යටතේ දක්වා ඇති අතර මෙමඟින් මුළු පුනරාවර්ථන වියදමෙහි වෙනසක් නොවේ. මෙය 2024 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කර සැසදීම් දත්ත සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ඒ ඒ වියදම් නිවැරදි බණ්ඩ යටතේ දක්වමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුයි. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ආකෘති 03 කේවළ ශේෂ වර්ගීකරණ සාරාංශයෙහි වසර ගණනාවක සිට පවතින නිශ්චිතව හඳුනා නොගත් රු.268,265 ක අය විය යුතු ශේෂයක් විය. | හඳුනා නොගත් මෙම ශේෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් විමසා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටියි. | හිඟ හිටි ණය ශේෂ හඳුනාගෙන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු කර කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුයි. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් රෙගුලාසි 109 යටතේ වන පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.698,025 ක් වන පාඩු හා අත්හැරීම්, හානි පාඩු ලේඛනයෙහි සඳහන් කර නොතිබුණි. | පෙර සිටම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇති මෙම අලාභයන් ඉදිරියේදී පරීක්ෂා කර බලා හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමටත් හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමටත් කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 57 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබුණු වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛවල පනවා තිබුණු වියදම් සීමා කිරීම් පසුගිය වර්ෂයේ දීර්ඝ කාලයක් තුළ පැවති අධික වර්ෂාව හේතුවෙන් මාර්ග අළුත්වැඩියා කටයුතු සැලසුම් කල පරිදි සිදු කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී අවසන් කළ යුතු බවට සඳහන් කරමින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් බුන්දල ජාතික වනෝද්‍යානයේ නරඹන්නන් සඳහා වූ මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීමේ කාර්යය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රු.9,897,160 ක ප්‍රතිපාදනයෙන් සියයට 85.9 ක් වූ රු.8,502,160 ක් එම කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වීම මත වර්ෂය අවසානයේඑම අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි. | මේ සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හරහා ටෙන්ඩර් කැඳවා 2023 ඔක්තෝබර් මස 13 දින ටෙන්ඩර් ප්‍රදානය කර ගිවිසුම් අත්සන් තබන ලදී. එසේම 2023 වර්ෂය අවසානයේ අඛණ්ඩව පැවති අධික වර්ෂාව හේතුවෙන් මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාද විය. | වෙනත් අමාත්‍යාංශයන් විසින් ලබාදුන් ප්‍රතිපාදන සැලසුම්සහගතව සහ කාර්යක්ෂමව උපයෝජනය කර අදාළ කාර්ය නියමිත කාලය තුළදී සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලින් නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධන) පනත | | | | |
| | **i.** 4 වගන්තිය | | සෑම ස්වභාවික රක්ෂිතයක් හා අභය භූමියක් වෙනුවෙන්ම මෙහෙයුම් සැලැස්මක් පිළියෙල කර සෑම වසර පහකට වරක්ම ඒවා ඇගයීමකට ලක් කර අවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතු වුවද මිරිස්ස, කල්පිටිය, හික්කඩුව යන<br><br>සමුද්‍රීය රක්ෂිත සහ මාදුගඟ අභයභූමිය වෙනුවෙන් එවැනි සැලසුම් පිළියෙල කර නොතිබුණි. | මේ වනවිට කමිටුවක් ස්ථාපිත කර දෙපාර්තමේන්තු ආකෘතියක් අනුව කළමනාකරණ සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත. | පනත ප්‍රකාරව සෑම ස්වභාවික රක්ෂිතයක් හා අභය භූමියක් වෙනුවෙන් මෙහෙයුම් සැලසුම් පිළියෙල කළ යුතුය. |
| | ii. 14 වගන්තිය | | යම් ජාතික රක්ෂිත භූමියක මායිමේ සිට සැතපුම් 01 ක දුරක් ඇතුළත පෞද්ගලික හෝ රජයේ හෝ යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව කවර ආකාරයක හෝ සංවර්ධන ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු වුවද, එවැනි ලිඛිත අවසරයකින් තොරව හික්කඩුව සමුද්‍රීය උද්‍යානයේ ප්‍රවේශ | හික්කඩුව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා යෝජනාවක් උද්‍යාන භාරකරු විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ හික්කඩුව නගර සභාවට එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | පනත ප්‍රකාරව සමුද්‍ර උද්‍යානයට අයත් වෙරළ කලාපය මනා සුපරීක්ෂණයක් සහිතව ආරක්ෂා කර ගැනීමටත් ඒ තුළ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මාර්ගය අවහිර වන පරිදි හා සමුද්‍ර උද්‍යානයට අයත් වෙරළ කලාපය තුළ අනවසර වෙළඳ ස්ථාන සහ සංචාරක විවේකී ස්ථාන ස්ථාපිත කර තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 81 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ක් ඉක්ම වූ රු.1,580,671 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | රු.113,380 ක් වූ ණය ශේෂයන් කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමු කර ඇත. තව දුරටත් අයවිය යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් උරුමකරුවන් පිළිබඳව සහ වත්කම් පිළිබඳව තොරතුරු ලබා ගෙන නීතිපති උපදෙස් මත අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් සිටිමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර හිඟ හිටි ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 05 ඡේදය | සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සියයට 15 කින් ඉහළ දැමිය යුතු වුවද, 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසන් වන විට වසර 11 ක් ගත වී තිබුණු බෝට්ටු ලියාපදිංචි ගාස්තු සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | මුහුදු ක්ෂීරපායීන් නැරඹීමේ බෝට්ටු ලියාපදිංචි ගාස්තු සංශෝධනය සඳහා සකස් කරන ලද ගැසට් පත්‍රය නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගාස්තු සංශෝධනය කළ යුතුය. |
| (ඈ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ යේ 06 ඡේදය | හානි පාඩු ලේඛනයෙහි සඳහන් රු.1,662,317 ක හානි හා පාඩු 10 ක් මුල්‍ය ප්‍රකාශවල ඇමුණුම (II) ආකෘතියේ පොත්වලින් කපා හැරීම් පිළිබඳ | මෙම හානි පාඩු පෙර වර්ෂවල සිටම මුල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොමැති අතර, ඉදිරියේදී එය නිවැරදි කිරීමට | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | කටයුතු කරන බව දන්වා සිටිමි. | |
| (ඉ) | 2012 සැප්තැම්බර් මස 06 දිනැති අංක 1774/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 12 වන නියෝගය | මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මුහුදට රැගෙන යන සෑම මගී යාත්‍රාවකම දෙපාර්තමේන්තුව විසින් පුහුණු කරනු ලැබූ ලියාපදිංචි මාර්ගෝපදේශකයෙකු සිටිය යුතු වුවද, මිරිස්ස තල්මසුන් නැරඹීම සඳහා යාත්‍රා කරන බෝට්ටු වල එවැනි මාර්ගෝපදේශකයෙකු සේවයට යොදවා නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට සහ මාර්ගෝපදේශකයින් හෝ සහායක ක්‍රියාකරු එම කාර්ය ඉටුකරලීමට යෙදවීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලෙසට කලාප සහකාර අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. | ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු.7,094,700 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ කාර්යයන් 33 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විදුලි වැට කණු කොන්ක්‍රීට් කිරීම ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවීම සහ සමිති මඟින් අදාළ කාර්යයන් සිදුකළ නොහැකි බව දැනුම් දීම මේ සඳහා හේතු විය. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් බැහැරවීම් වලදී සැලසුම් සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මිළදී ගෙන රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන වටිනාකම රු.2,818,200 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම තක්සේරු නොකළ nut & bolt 122 ක් සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ බවට නිරීක්ෂණය වූ අතර එම අලාභය සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සොරුන් විසින් රැගෙන ගිය භාණ්ඩ හා එම සිදුවීම සම්බන්ධව මූලික විමර්ශනයක් අනුරාධපුර වනජීවී කලාපයේ සහකාර අධ්‍යක්ෂකගේ සහභාගීත්වයෙන් සිදු කරමින් පවතියි. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර මෙම අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මාදු ගඟ අභය භූමියක් ලෙසට ප්‍රසිද්ධ කිරීමට අදාළ 2006 ජූලි 17 දිනැති අංක 1454/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි එය ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා තිබෙන බවට වූ වරද නිවැරදි කර නිවැරදි මායිම සලකුණු කිරීමට හා අභය භූමිය නිවැරදිව සිතියම් ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර මාදු ගඟ නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ගෙන් ප්‍රවේශපත්‍ර ගාස්තුවක් අය කිරීමටද කටයුතු කර නොතිබුණි. | මාදුගඟ අභයභූමිය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමේදී සිදුව ඇති තාක්ෂණික දෝෂ මගහරවා ගෙන නව මායිම් සහිතව ගැසට් නිවේදනය සංශෝධනය කිරීම 2024 වර්ෂය තුළදී සිදු කිරීමට අපේක්ෂිතය. එසේම මාදුගඟ ජාතික උද්‍යානයක් ලෙස උසස් කර නොමැති බැවින් ගාස්තුවක් නියම කිරීමට නොහැකි වුවද මීළඟ ගාස්තු සංශෝධනයේදී සංචාරක සේවා සඳහා ගාස්තු අයකිරීම ඊට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | මාදු ගඟ අභය භූමියේ මායිම් නිවැරදිව සිතියම් ගත කිරීමටත්, එය ජාතික උද්‍යානයක් ලෙස උසස් කර ගාස්තු අය කර ගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය |
| (ආ) | 2023 ජනවාරි 01 දින සිට 2023 ජූනි 30 දක්වා කාලය තුළ හික්කඩුව සමුද්‍රීය උද්‍යානය නැරඹීමට පැමිණි සංචාරකයන්ගෙන් අයකළ මුළු ප්‍රවේශපත්‍ර ගාස්තුව රු.2,226,915 ක් සහ සේවා ගාස්තුව රු.2,761,362 ක් වීමෙන් ප්‍රවේශපත්‍ර ගාස්තුවට වඩා රු.534,447 කින් සේවා ගාස්තුව වැඩි වී තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් සංචාරයකයන්ට සපයන සේවාවන් ඉතා අවම මට්ටමක පැවතුණි. | හික්කඩුව ජාතික උද්‍යානයේ සේවා ගාස්තු අය කිරීම කණ්ඩායම් පදනමින් නොව එක් පුද්ගලයකු සඳහා අය කිරීම මේ සඳහා තිබෙන වඩා ප්‍රශස්තම විසඳුම බව උද්‍යාන භාරකරු පෙන්වා දී ඇති අතර, ඉදිරියේදී ඒ සම්බන්ධව සලකා බැලීමට නියමිතය. | සංචාරකයන්ගෙන් අයකරනු ලබන ගාස්තුවට සරිලන සේවාවක් සැපයීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | උඩවලව සහ යාල වනෝද්‍යානවල ඇති සංචාරක නිවාස වල පානිය ජලය නොතිබීම, සූර්ය පැනල මඟින් ලබා දෙන විදුලිය සංචාරක නිවාසවල සාමාන්‍ය විදුලි | 2024 වසර තුළ දී සංචාරක නිවාස කිහිපයක සූර්ය ජනන යන්ත්‍ර අළුත්වැඩියාව සඳහාත් ලබාදී ඇති සූර්ය බල පද්ධති ප්‍රමාණවත් | සංචාරක ආකර්ෂණය වැඩි වන ආකාරයට සියළුම සංචාරක සේවා ඉහළ ගුණාත්මකභාවයකින් යුක්තව පවත්වා |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවීම, ගෘහභාණ්ඩ ඉතාමත් පැරණි තත්ත්වයේ පැවතීම, සංචාරක නිවාසවල රාජකාරී කටයුතු නිසි පුහුණුවක් නොලැබූ ස්වේච්ඡා මාර්ගෝපදේශකවරුන් විසින් සිදු කිරීම සහ සංචාරක බංගලා පූර්ණ නවීකරණයකට ලක් කිරීමට කටයුතු කර නොතිබීම යනාදී වශයෙන් සංචාරක නිවාසවල අඩුපාඩු පැවතීමත්, සෆාරි ජීප්රථ නියාමනය නොකිරීම නිසා පවතින ගැටළුත් සංචාරක ආකර්ශනය කෙරෙහි අහිතකර ආකාරයට බලපානු ලබන බවට නිරීක්ෂණය විය. | නොවන සංචාරක නිවාස සඳහා නව සූර්ය බල පද්ධති ස්ථාපිත කිරීමටත් කටයුතු කරමින් පවතින අතර පානීය ජලය සැපයීමට උද්‍යාන පිවිසුම් ආශ්‍රිතව ප්‍රති ආසෘතිකරණ යන්ත්‍රයන් පිහිටුවීමට සැලසුම් කර ඇත. | ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය තුළදී විදුලි වැට ඉදිකිරීම සඳහා රු.58,640,147 ක් හා එහි නඩත්තුව සඳහා රු.14,433,552 ක් ද ඇතුළුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ පමණක් විදුලි වැට සඳහා වැය කර තිබුණු මුදල රු.2,355,882,248 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට විදුලි වැටෙහි සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 5,389.97 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවීය | විශාල වශයෙන් සිදුකරන සංවර්ධන කටයුතු හේතුවෙන් අලීන්ගේ වාසභූමි අහිමි වීම, අලි ගැවසෙන ප්‍රදේශවල හා ඒ අවට ගම්මානවල සිදු කරන ඉඩම් පරිහරණය, මිනිසුන්ගේ නොසැලිකිළිමත් බව, රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ සිදු කරන වගාවන් සඳහා අලින්ගේ ආකර්ශනය සහ නිවාස වල වී ගබඩා කිරීම වැනි කරුණු නිසා දේපළ හානි හා ශාරීරික හානි වර්ධනය වී ඇත. | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සුදුසු උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තබ්බෝව අභයභූමියේ හෙක්ටයාර 315 ක කලපු අන්දර ඉවත් කර වාසස්ථාන සුපෝෂණය සඳහා රු.57,401,665 ක් ද, ඉවත් කළ ප්‍රදේශය නඩත්තුව සඳහා රු.5,865,900 ක් ද වැය කර තිබුණු නමුත්, 2023 වර්ෂය අවසන් වන විටත් විශාල භූමි ප්‍රදේශයක කලපු අන්දර වැවී තිබුණි. මේ හේතුවෙන් අලි ඇතුන්ට රක්ෂිතයෙහි රැඳී සිටීමට | ඵලදායීතාවය සනාථ කර ගැනීම සඳහා විධිමත් විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කර එහි නිර්දේශ අනුව ඉදිරි කලපු අන්දර ඉවත් කිරීම හා නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ. | ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් එහි නඩත්තු කටයුතු සිදුකළ යුතුය. |

අපහසු වී ඔවුන් කිලෝමීටර් 50 ක් පමණ ඈත ගම්මානවලට ගමන් කරන බව නිරීක්ෂණය විය.

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට 2,891 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 37 ක් ඇතුලුව දෙපාර්තමේන්තුවේ තනතුරු 977 ක් පුරප්පාඩු වී පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් බඳවා ගැනීම් දැඩි ලෙස සීමා කර තිබූ බැවින් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ නොහැකි වී තිබූ අතර, බඳවා ගැනීමේ සමාලෝචන කමිටුව මගින් සිදු කරනු ලැබූ ඉල්ලීම මත බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් ඒ අනුව බඳවා ගැනීමේ කටයුතු සිදු කරන බවත් දන්වමි. | කාර්යසාධනය සඳහා අහිතකර ලෙස බලපාන අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පුරවා දෙපාර්තමේන්තුවේ කටයුතු මනා අයුරින් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය |